# 3 බහු සංස්කෘතික සමාජය

## 3.1 බහු සංස්කෘතික සමාජය හඳුනාගනිමු

### 3.1.1. සංස්කෘතියක් යනු කුමක් ද?

සංස්කෘතිය යන්නට නිර්වචන රාශියකි. සමාජ විද්‍යාඥයින්, දේශපාලන විද්‍යාඥයින්, ඉතිහාසඥයින් මේ පිළිබඳ ව විවිධ අදහස් දක්වා තිබේ.

ඊ. බී. ටයිලර් නම් මානව විද්‍යාඥයා විසින් "සංස්කෘතිය" යන්න මෙසේ විස්තර කර ඇත.


**"සංස්කෘතිය යනු දැනුම, ඇදහිලි, කලා, නීති, සිරිත් විරිත්, ඇගයීම් හා මිනිසා විසින් සමාජයේ ජීවත්වන පුද්ගලයකු වශයෙන් ලබාගන්නා වූ පුරුදු, ඇබ්බැහිකම් හා හැකියාවන්ගේ සමස්තයයි".**

ඉහත කියමනෙන් පෙනී යන්නේ අපගේ සියලු ම ක්‍රියාකාරකම් හා සිතුම් පැතුම් සංස්කෘතිය යන්නට අයත් වන බවයි.

අපි කවුරුත් සමාජය පිළිගත්, ජීවන රටාවකට අනුව හැඩගැසී සිටිමු. මේ හැඩගැස්ම හෙවත් හැදියාව සංස්කෘතියයි. පුද්ගලයෙකු වශයෙන් උපතේ සිට මරණය දක්වා අප හැසිරෙන්නේ අපේ සංස්කෘතියට අනුවයි.

*"ඔබ කතා කරන්නේ මිනිසුන් ගැන ද, එසේනම් ඔබට අනිවාර්යයෙන් ම සංස්කෘතියක් ගැන කතා කිරීමට සිදුවනු නියත ය."*

◆ *බර්නාඩ් රොෆන්සන්බර්ග් සහ ලේවිස් කොසර්.*



- සෑම සමාජයක ම සංස්කෘතිය මගින් එම සමාජයේ පැවැත්ම සඳහා වැදගත් කාර්ය භාරයක් ඉටුකෙරේ. කාලාන්තරයක් මුළුල්ලේ ක්‍රමයෙන් සමාජය තුළ ගොඩනැගෙන සංස්කෘතිය වෙනස් වෙමින්, වර්ධනය වෙමින් පවතින ක්‍රියාවලියකි.

- සංස්කෘතිය පුද්ගලයා ජීවත් වන සමාජය අනුව වෙනස් වේ. මේ නිසා විවිධ සමාජයන්හි ඔවුන්ට ම ආවේණික වූ සංස්කෘතීන් නිර්මාණය වී තිබේ.

**ක්‍රියාකාරකම් 3.1**

ඔබ ජීවත් වන සමාජයේ කිසියම් උත්සව අවස්ථාවක දක්නට ලැබෙන ක්‍රියාවලිය නිරීක්ෂණය කර එය පියවරෙන් පියවර සටහන් කරගන්න. ඒ සියලු අවස්ථාවන්, සංස්කෘතිය නිරූපණය කරන අංග ලෙස හඳුනාගන්න.

### 3.1.2 බහු සංස්කෘතික සමාජය

විවිධ සංස්කෘතීන්ට අයත් පුද්ගලයින්, එක ම සමාජයක ජීවත් වන්නේ නම්, එවැනි සමාජයක් බහු සංස්කෘතික සමාජයක් ලෙස හඳුන්වනු ලැබේ.

බහු සංස්කෘතික සමාජයක විවිධ භාෂා කතා කරන, විවිධ ආගම් අදහන, විවිධ සිරිත් විරිත් අනුගමනය කරන පිරිස් එක ම පාලන ව්‍යුහයක් තුළ ජීවත්වෙති. වර්තමාන ලෝකයේ බොහෝ රටවල් බහු සංස්කෘතික සමාජ ලෙස හඳුනාගත හැකි ය.

ශ්‍රී ලංකාව ද බහු සංස්කෘතික සමාජයකට හොඳ උදාහරණයකි.

### 3.1.3 බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ

සෑම බහු සංස්කෘතික සමාජයකට ම පොදු මූලික ලක්ෂණ කීපයක් මෙසේ හඳුනාගත හැකි ය.

- විවිධ ජාතීන්ට, ආගම්වලට, ගෝත්‍ර හෝ කුලවලට අයත් පිරිස් එක් පාලන ඒකකයක් තුළ (රටක් තුළ) ජීවත් වීම.

- ඒ ඒ සංස්කෘතීන්ට ආවේණික, කැපී පෙනෙන සිරිත් විරිත්, ආචාර ධර්ම හා ඇගයීම් පද්ධතියක් පැවතීම.

- එක් එක් සංස්කෘතියට අයත් ජන කොටස්, ප්‍රාදේශීය වශයෙන් ඒකරාශී වීමට උත්සාහ දැරීම.

- සංස්කෘතික ඒකාබද්ධතාව හා සමෝධානය ඇති කරගත් සමාජ සංවර්ධන ඉලක්ක කරා ළඟා වී සිටීම.

### 3.1.4 ශ්‍රී ලංකාව ද බහු සංස්කෘතික සමාජයකි

ශ්‍රී ලංකාව ද විවිධ ජනවර්ගවලට අයත් විවිධ ආගම් අදහන, විවිධ භාෂා කතාකරන පිරිස් ජීවත්වන බහු සංස්කෘතික සමාජයක් ලෙස හඳුනාගත හැකි ය.

ශ්‍රී ලංකාවේ සිංහල, ශ්‍රී ලාංකික දෙමළ, ඉන්දියානු දෙමළ හා යෝනක යන ප්‍රධාන ජනකොටස් ජීවත් වෙති. මීට අමතර ව බර්ගර්, මැලේ යන ජන කොටස් ද, ආදි වාසී (වැදි ජනතාව), කැෆ්රි ජනතාව, අභිගුණ්ඨික ජනතාව හා ගාඩි වංශිකයින් ද ශ්‍රී ලංකාවේ ජීවත් වන සුළු ජන කොටස්වලට අයත් වේ.

ජනවර්ග අනුව ලංකාවේ ජනගහන ප්‍රතිශතය

| ජනවර්ගය | ප්‍රතිශතය % |
|---|---|
| සිංහල | 74.0 |
| ශ්‍රී ලංකා දෙමළ | 12.6 |
| ඉන්දියානු දෙමළ | 5.5 |
| මුස්ලිම් (යෝනක) | 7.1 |
| වෙනත් | 0.8 |
| | 100.00 |

වගු අංක 3.1

මූලාශ්‍රය : ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත 2006 ශ්‍රී ලංකා මහ බැංකුව

## ක්‍රියාකාරකම් 3.2



(1)



(2)



(3)



(4)



(5)



(6)

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජනවර්ග නිරූපණය වන චිත්‍ර 6 ක් මෙහි දක්වා ඇත. එක් එක් චිත්‍රයෙන් දක්වෙන්නේ කවර ජන වර්ගයක් ද යන්න හඳුනා ගෙන ඔබේ පොතේ සටහන් කරන්න.

ජාතීන් සහ දිස්ත්‍රික්ක අනුව ජනගහණය, සංගණනය 1981, 2001

**Population by ethnic group and district, Census 1981, 2001**

| දිස්ත්‍රික්කය | District | 1981 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | එකතුව<br>Total | සිංහල<br>Sinhalees | ශ්‍රී ලංකා දෙමළ<br>Sri Lanka Tamil | ඉන්දියානු දෙමළ<br>Indian Tamil | ශ්‍රී ලංකා මුස්ලිම්<br>Sri Lanka Moor | ලංසි<br>Burgher | මැලේ<br>Malay | අනිකුත්<br>Others |
| ශ්‍රී ලංකාව | **Sri Lanka** | **14,846,750** | **10,979,568** | **1,886,884** | **818,656** | **1,048,927** | **39,374** | **46,963** | **28,398** |
| කොළඹ | Colombo | 1,699,241 | 1,318,835 | 170,590 | 19,824 | 139,743 | 19,688 | 22,233 | 8,328 |
| ගම්පහ | Gampaha | 1,390,882 | 1,279,512 | 48,182 | 5,919 | 37,826 | 8,423 | 8,675 | 2,325 |
| කළුතර | Kalutara | 829,704 | 723,433 | 9,744 | 33,659 | 61,159 | 431 | 762 | 456 |
| මහනුවර | Kandy | 1,045,317 | 775,501 | 62,791 | 88,436 | 109,779 | 2,122 | 2,755 | 3,633 |
| මාතලේ | Matale | 357,354 | 285,354 | 20,579 | 24,912 | 24,995 | 272 | 574 | 558 |
| නුවර එළිය | Nuwara-Eliya | 603,577 | 254,375 | 76,449 | 257,478 | 12,163 | 696 | 1,135 | 1,280 |
| ගාල්ල | Galle | 814,531 | 769,343 | 7,271 | 11,068 | 25,878 | 288 | 188 | 709 |
| මාතර | Matara | 643,766 | 606,516 | 4,683 | 13,875 | 16,122 | 205 | 79 | 306 |
| හම්බන්තොට | Hambantota | 424,344 | 412,055 | 2,500 | 284 | 4,899 | 82 | 4,445 | 79 |
| යාපනය | Jaffna | 830,552 | 6,659 | 790,385 | 19,960 | 12,850 | 383 | 72 | 115 |
| මන්නාරම | Mannar | 105,235 | 8,683 | 54,474 | 13,850 | 27,717 | 35 | 35 | 1,440 |
| වවුනියාව | Vavuniya | 95,428 | 15,794 | 54,179 | 18,714 | 6,505 | 25 | 34 | 177 |
| මුලතිව් | Mulaitivu | 77,189 | 3,992 | 58,209 | 11,215 | 3,651 | 95 | 19 | 08 |
| මඩකලපුව | Batticaloa | 330,333 | 11,255 | 233,713 | 4,074 | 78,829 | 2,292 | 46 | 124 |
| අම්පාර | Ampara | 368,970 | 148,943 | 77,826 | 1,711 | 161,588 | 697 | 168 | 357 |
| ත්‍රිකුණාමලය | Trincomalee | 255,948 | 85,503 | 67,760 | 5,372 | 75,038 | 1,169 | 531 | 274 |
| කුරුණෑගල | Kurunagala | 1,211,801 | 1,125,912 | 14,920 | 6,616 | 60,791 | 562 | 1,259 | 1,741 |
| පුත්තලම | Puttalam | 492,533 | 407,067 | 32,282 | 2,289 | 49,000 | 440 | 954 | 501 |
| අනුරාධපුරය | Anuradhapura | 587,929 | 535,834 | 8,026 | 719 | 41,777 | 228 | 338 | 1,007 |
| පොළොන්නරුව | Polonnaruwa | 281,563 | 238,965 | 5,267 | 124 | 16,638 | 59 | 109 | 433 |
| බදුල්ල | Badulla | 640,952 | 443,024 | 37,520 | 129,496 | 26,600 | 613 | 1,419 | 2,278 |
| මොණරාගල | Monaragala | 273,570 | 253,572 | 5,345 | 8,859 | 5,312 | 70 | 183 | 218 |
| රත්නපුර | Ratnapura | 797,067 | 677,510 | 19,094 | 84,740 | 13,781 | 342 | 412 | 1,195 |
| කෑගල්ල | Kegalla | 694,944 | 588,581 | 15,074 | 45,752 | 34,389 | 156 | 229 | 763 |

වගු අංක 3.1

ආගම් අනුව ශ්‍රී ලංකාවේ ජනගහන ප්‍රතිශතය.

| ආගම | ප්‍රතිශතය % |
|---|---|
| බෞද්ධ | 69.3 |
| හින්දු | 15.5 |
| ඉස්ලාම් | 7.5 |
| ක්‍රිස්තියානි | 7.6 |
| වෙනත් | 0.1 |
| | 100.0 |

වගු අංක 3.2

මූලාශය : ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත 2006 ශ්‍රී ලංකා මහ බැංකුව


ආගම් අනුව සැලකූ විට ශ්‍රී ලංකාවේ බෞද්ධ, හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි හා රෝමානු කතෝලික යන ප්‍රධාන ආගම් අදහන පිරිස් ජීවත් වෙති.




(1)



(2)



(3)



(4)

3.4 රූපය

**ක්‍රියාකාරකම් 3.3**

මෙම චිත්‍රවලින් දැක්වෙන ආගමික සිද්ධස්ථාන හඳුනා ගෙන ඒ ඒ අංක අනුව ඔබේ පොතේ සටහන් කරන්න.

**ක්‍රියාකාරකම් 3.4**

- ඔබ ප්‍රදේශයේ ජීවත් වන වෙනත් සංස්කෘතීන්ට අයත් ජන කොටස් පිළිබඳ ව තොරතුරු සොයා පහත වගුව සම්පූර්ණ කරන්න.

| ජන වර්ගය | අදහන ආගම | ප්‍රධාන ආහාර | ඇඳුම් පැළඳුම් | කතාකරන භාෂාව |
|---|---|---|---|---|
| | | | | |

## 3.2 බහු සංස්කෘතික සමාජයක් ඇති වීම කෙරෙහි බලපාන සාධක

"ලෝකයේ කිසි ම සංස්කෘතියක් එක් වර්ගයකින් සමන්විත නො වේ" යන්න මානව විද්‍යාඥයින්ගේ පිළිගැනීමයි. සෑම සංස්කෘතියක් ම වෙනත් සංස්කෘතීන්ගේ බලපෑමට ලක් ව තිබේ. ඒ අනුව සංස්කෘතීන් වෙනස් වීමත්, බහු සංස්කෘතික සමාජය බිහිවීමත් සිදු වේ.

බහු සංස්කෘතික සමාජ බිහිවීම කෙරෙහි බලපාන සාධක මොනවා ද යි විමසා බලමු.

- සංස්කෘතික සම්කර්පනය
- විසරණය
- වාණිජ්‍යකරණය
- සංක්‍රමණ
- නව සොයාගැනීම හා නිපදවීම්
- සන්නිවේදන මාධ්‍යයන්හි දියුණුව
- ප්‍රවාහන ක්‍රමවල දියුණුව
- ගෝලීයකරණය

### 3.2.1 සංස්කෘතික සම්කර්පනය

කිසියම් බලගතු සංස්කෘතියක් විසින් තවත් සංස්කෘතියක් ආක්‍රමණය කළ අවස්ථාවක, ප්‍රබල සංස්කෘතිය විසින් යටත් වූ සංස්කෘතිය වෙත ඔවුන්ගේ සංස්කෘතියට ආවේණික ලක්ෂණ ආරෝපණය කිරීම තුළින්, බහු සංස්කෘතික සමාජයක් බිහිවන්නේ ය. මෙවැනි තත්ත්වයක් සංස්කෘතික සම්කර්පනය නමින් හඳුන්වයි.

උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාව යුරෝපීය ජාතීන්ගේ යටත් විජිතයක් බවට පත්වීමෙන් පසු ව, ක්‍රිස්තියානි ආගම ප්‍රචාරය කිරීමත් සමග ඒ හා බැඳුණු නව සංස්කෘතික රටාවක් බිහි වීම පෙන්වා දිය හැකි ය.

### 3.2.2 විසරණය

විසරණය යනුවෙන් අදහස් වන්නේ එක් සංස්කෘතියක් තුළ බිහිවන සමහර අංග ලක්ෂණ තවත් සංස්කෘතියක් තුළ ව්‍යාප්ත වීමයි. මෙය බලෙන් සිදුකරන්නක් නො වේ. එක් සංස්කෘතියක අංග ඔස්සේ තවත් සංස්කෘතියක් පෝෂණය වීම මෙහි දී සිදු වේ. මේ අනුව විසරණය නිසා ද සංස්කෘතියක් තුළ වෙනස්කම් ඇති වේ.

විසරණය ප්‍රධාන වශයෙන් ක්‍රම තුනකට සිදු වේ.

*i. ඍජු විසරණය*

එක් සංස්කෘතියක් තුළ බිහි වූ ඉතා වැදගත් අංගයක්, ඉතා ඉක්මනින් අනෙකුත් සංස්කෘතීන් කරා පැතිර යාම ඍජු විසරණයයි.

ක්‍රි. ව. 105 දී පමණ චීනයෙහි කඩදාසි නිෂ්පාදනය ආරම්භ වූ අතර එය අනෙකුත් රටවල් කරා වේගයෙන් පැතිර ගියේ ය.

*ii. අන්තර් සම්බන්ධතා නිසා ඇති වන විසරණය*

සංස්කෘතීන් අතර ඇති වන දේශපාලන, සංස්කෘතික හා සමාජීය සම්බන්ධතා නිසා සංස්කෘතික සංකලන ඇති වීමෙන් බහු සංස්කෘතික සමාජ බිහි වේ.

පැරණි රජවරු දකුණු ඉන්දීය බිසෝවරුන් සරණ පාවා ගැනීම හේතුවෙන් හින්දු සංස්කෘතිකාංග ශ්‍රී ලාංකික සංස්කෘතියට එක් විය.

*iii. ප්‍රබෝධාත්මක විසරණය*

තම සංස්කෘතියේ ප්‍රගමණය සඳහා වෙනත් සංස්කෘතියක අංග එකතු කර ගැනීම ප්‍රබෝධාත්මක විසරණයයි. මෙය ද බහු සංස්කෘතික සමාජ බිහිවීම කෙරෙහි බලපායි.

මහින්දාගමනයත් සමඟ බෞද්ධ සංස්කෘතිකාංග ශ්‍රී ලාංකික සංස්කෘතියට එක් විය.

### 3.2.3 කැරලි හා විප්ලව

කැරලි හා විප්ලව ද බහු සංස්කෘතික සමාජ බිහිවීම කෙරෙහි බලපා තිබේ. කැරැල්ලකින් හෝ විප්ලවයකින් පසු ව බිහිවන සමාජය ඔවුන්ට ම ආවේණික සංස්කෘතියක් බිහිකර ගන්නට උත්සාහ කරනු පෙනේ.

ඇල්ජීරියානුවන් නිදහස් සටනක් මගින් ප්‍රංශයෙන් නිදහස ලබා ගත් පසු වෙන ම පාලන ක්‍රමයක් හා සංස්කෘතියක් සහිත ඇල්ජීරියාව නම් රාජ්‍යය බිහිවිය.

### 3.2.4 වාණිජකරණය

අන්තර් ජාතික වෙළඳාම් කටයුතු දියුණු වීම නිසා එමගින් සංස්කෘතිකාංග හුවමාරුවක් සිදු වන අතර එය ද බහු සංස්කෘතික සමාජ බිහිවීමට බලපා තිබේ.

වෙළඳාම් කටයුතු සඳහා පැමිණි අරාබි ජාතිකයන්ගේ බලපෑම හේතුවෙන් ඉස්ලාම් සංස්කෘතිය ලාංකීය සමාජය තුළ ස්ථාපිත විය.

### 3.2.5 සංක්‍රමණ

සංචාරක කටයුතු සඳහාත්, රැකියා කිරීම, අධ්‍යාපනය ලැබීම වැනි විවිධ හේතු මත රටකින් තවත් රටකට (සංස්කෘතියකින් තවත් සංස්කෘතියකට) සංක්‍රමණය වන පිරිස්වල බලපෑම හේතුවෙන් සංස්කෘතික ලක්ෂණ මිශ්‍ර වීමක් සිදු වේ.

බ්‍රිතාන්‍ය යුගයේ දී වතු වගා කටයුතු සඳහා ඉන්දියාවෙන් පැමිණි ද්‍රවිඩ කම්කරු ජනතාව උඩරට වතු ආශ්‍රිත ව පදිංචි වීම නිසා ඉන්දියානු ද්‍රවිඩ සංස්කෘතිය ශ්‍රී ලාංකීය සමාජයට එකතු විය.

### 3.2.6 නව සොයාගැනීම් හා නිපදවීම්

විද්‍යාත්මක හා තාක්ෂණික දියුණුව ඔස්සේ දිනපතා පරිභෝජනයට එක්වන උපකරණ ආදිය මගින් ද සංස්කෘතියෙහි වෙනස්කම් සිදු වේ.

ට්‍රැක්ටරය නිපදවීම නිසා එතෙක් කෘෂිකාර්මික කටයුතුවල දී සතුන්ගේ ශ්‍රමයෙන් සිදු කළ කාර්යාවලි වෙනස් විය. මෙය ශ්‍රී ලාංකික සමාජ සංස්කෘතියෙහි නව වෙනස්කම් සිදු කළේ ය.

### 3.2.7 ජනමාධ්‍ය හා තොරතුරු තාක්ෂණයේ දියුණුව

ජනමාධ්‍ය හා තොරතුරු තාක්ෂණයේ දියුණුව සංස්කෘතික වෙනස්කම් හා ඒ ඔස්සේ බහු සංස්කෘතික සමාජ බිහිවීම කෙරෙහි බලපායි.

අන්තර්ජාලය වැනි මාධ්‍යයන් ඔස්සේ සංස්කෘතික අංග හුවමාරුව වේගවත් ව සිදු වේ.

### 3.2.8 ගෝලීයකරණය

විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුව මගින් ලෝකයේ සියලු ම රටවල් එක් ඒකකයක් ලෙස (විශ්ව ගම්මානයක්) කටයුතු කරන්නට උත්සාහ කිරීම ගෝලීයකරණය නමින් හඳුන්වනු ලැබේ. මේ ඔස්සේ ලෝකයේ සෑම සංස්කෘතියක් ම වෙනස් වීමට භාජන විය හැකි ය. එය බහු සංස්කෘතික සමාජ බිහිවීම කෙරෙහි බලපාන්නේ ය.

ප්‍රවාහන ක්‍රමවල දියුණුව නිසා ද සංස්කෘතියකින් සංස්කෘතියකට වඩාත් පහසුවෙන් සංස්කෘතිකාංග පැතිර යයි.

වර්තමානයේ අපේ සංස්කෘතියට එක් වී ඇති විවිධ ආහාර වර්ග, ඇඳුම් විලාසිතා ජීවන රටා ආදිය ගෝලීයකරණය ඔස්සේ පැමිණි දේ ය.

## 3.3 බහු සංස්කෘතික සමාජ හා නූතන ජාතික රාජ්‍යය

"නූතන ජාතික රාජ්‍යය" නම් දේශපාලන සංකල්පය, වර්තමාන ලෝකයේ අගය කිරීමට ලක්වන රාජ්‍ය පාලනය පිළිබඳ සංකල්පයකි. මෙයින් අදහස් වන්නේ රාජ්‍යයක් යනු එක් ජාතියක් ය යන අදහසයි. රටක් තුළ විවිධ සංස්කෘතීන්ට අයත් පිරිස් ජීවත් වුවත් ඔවුන් එක් ජාතියක් ලෙස සැලකිය යුතු ය යන්න එමගින් කියවේ.

**ශ්‍රී ලංකාවේ සිංහල, දෙමළ, මුස්ලිම් හා වෙනත් ජනවර්ග සහ විවිධ සංස්කෘතීන්ට අයත් පිරිස් ජීවත් වුවත්, ඔවුන් ශ්‍රී ලාංකිකයින් ලෙස සැලකිය යුතු ය.**

ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන නූතන රාජ්‍ය උත්සාහ ගන්නේ විවිධ සංස්කෘතික අනන්‍යතාවන්ට ගරු කරමින්, ඒ සංස්කෘතික විවිධතා සමෝධානය කරමින්, එක් ජාතියක් වශයෙන් ස්වාධීන ව සංවර්ධනය කරා ගමන් කිරීමටයි.

නූතන රාජ්‍ය සියල්ල ම පාහේ බහු සංස්කෘතික සමාජ ලෙස ද හඳුනාගත හැකි ය. මෙම රාජ්‍ය අතර සංවර්ධිත රටවල් මෙන් ම සංවර්ධනය වෙමින් පවතින රටවල් ද දක්නට ලැබේ. සංවර්ධිත රටවල් ආර්ථික, සමාජයීය හා දේශපාලන ක්‍රියාවලියේ දී බහු සංස්කෘතික භාවය මනා පිළිවෙලක් කරගෙන තිබේ.

සිංගප්පූරුව, ස්විට්සර්ලන්තය වැනි රටවල් ජනතාවගේ විවිධ සංස්කෘතික වෙනස්කම්, තම රටේ දියුණුවට ආශිර්වාදයක් කර ගෙන තිබේ. "වෙනස්කම් තුළින් එකමුතු බව" යන්න තේමා කරගෙන එම රටවල් අද සංවර්ධිත තත්ත්වයකට පත් ව තිබේ. මෙම කාර්යයේ දී එම රටවල් ඒ ඒ ජනවර්ගයේ සංස්කෘතික ලක්ෂණයන්ට හානි නොකිරීමටත්, ඒවාට ගෞරව කිරීමටත් ක්‍රියාකර ඇත.

**ක්‍රියාකාරකම් 3.4**

- ඉහත පාඩමෙහි නොදක්වෙන වෙනත් බහු සංස්කෘතික නූතන රාජ්‍යයන් කීපයක තොරතුරු සොයා පන්තියට ඉදිරිපත් කරන්න.

## 3.4 බහු සංස්කෘතික සමෝධානය හා ශ්‍රී ලංකාව

ජන සමාජයක් හෝ රටක් තුළ ජීවත්වන සෑම සංස්කෘතියකට ම අයත් ජන කොටස් එකට ඒකාබද්ධ වීම තුළින් ගොඩනැගෙන ශක්තිය එම රටේ සංවර්ධනය සඳහා දායක කර ගැනීමට වර්තමානයේ සෑම බහු සංස්කෘතික රාජ්‍යයක් ම උත්සාහ ගනී.

ආගම්, කුල, ජාති, වර්ග, වර්ණ අනුව බෙදී සිටීමෙන් එක ම ජන වර්ගයකටවත් දියුණු වීමට නොහැකි ය. ශ්‍රී ලාංකික ජන කොටස් කුමන හේතුවක් නිසා හෝ භේද භින්න වී සිටී නම් එය රටේ ඉදිරි ගමනට බාධාවකි.

මිනිසුන් වශයෙන් අපි සියලු ම දෙනා එක හා සමාන වෙමු. ශ්‍රී ලාංකිකයින් වන අප සියලු ම දෙනාට ම ඇත්තේ සමාන අයිතිවාසිකම් ය. මූලික අවශ්‍යතා සෑම දෙනාට ම පොදු ය. සෑමට ම කුසගින්න, දුක, වේදනාව, දැනේ. පටු අවිචාරවත් මත භේද අනුව වෙන් ව සිටිනවාට වඩා වැදගත් වන්නේ මේ සමානකම් උපයෝගී කරගෙන එකට බැඳී සිටීම ය.

> *"සියලු මනුෂ්‍යයෝ නිදහස් ව, සමාන අයිතිවාසිකම් සහිත ව උපදිති. ඔවුන් ජනවර්ගය, ශරීර වර්ණය, ස්ත්‍රී පුරුෂභාවය, භාෂාව, ආගම, දේශපාලන අදහස්, ජාතිය වැනි විවිධතා නොසලකා එකට අයිතිවාසිකම් භුක්ති විඳිය යුතු ය."*
>
> - *එක්සත් ජාතීන්ගේ මිනිස් අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය*

ඈත අතීතයේ සිට ම ශ්‍රී ලංකාවේ සියලු ම ජනකොටස් අන්‍යෝන්‍ය වශයෙන් සහයෝගයෙන් කටයුතු කර ඇත. ඒ පිළිබඳ ව පහත දැක්වෙන උදාහරණ කීපය විමසා බලමු.

- ත්‍රිකුණාමලය ආසන්නයේ ඇති වෙල්ගම් වෙහෙර රාජ රාජ නම් චෝල අධිරාජයා විසින් ප්‍රතිසංස්කරණය කරන ලදුව "රාජ රාජ පෙරුම්පල්ලි" යනුවෙන් නම් කර තිබේ.
- I විජයබාහු රජුගේ නමින් "විජයරාජ ඊශ්වරම්" නම් ශිව දේවාලයක් කන්තලේ ප්‍රදේශයේ ඉදිකර තිබේ.
- යාපහුවේ I බුවනෙකබාහු රජු මුස්ලිම් දූතවරයෙකු මිසරයේ සුල්තාන්වරයා වෙත යවා තිබේ.
- පොළොන්නරුව රාජධානියේ I විජයබාහු රජ සමයේ දී දළදා වහන්සේ හා ඊට අයත් දේපොළ ආරක්ෂා කිරීම පවරා ඇත්තේ "වේලෙක්කාර" නම් දෙමළ ජාතික බලඇණියටයි.
- දෙවිනුවර පෙරහැරේ විශේෂාංගයක් ලෙස වේල් පෙරහැර පැවැත්වෙයි.
- මහනුවර ශ්‍රී දළදා පෙරහැරට විෂ්ණු, කතරගම, නාථ, පත්තිනි දේවාල පෙරහැර 4ක් ද එක් වී තිබේ.
- අප මවු බිමට නිදහස ලබාගැනීම සඳහා දියත් කළ සටනට ශ්‍රී ලාංකික සියලු ජන කොටස්වලට අයත් ජන නායකයන්ගේ දායකත්වය නොඅඩු ව ලැබී ඇත.

අපේ ඉතිහාසය තුළ මෙවන් උදාහරණ රාශියක් සොයාගත හැකි ය. ඒ තුළින් පැහැදිලි වන්නේ අතීතයේ සිට ම අප එක් ජාතියක් ලෙස එක් ව කටයුතු කර ඇති බවයි.



ශ්‍රී දළදා පෙරහැර



හින්දු ආගමික පෙරහැරක්

3.5 රූපය

වර්තමානයේ ද රටේ සෑම අංශයක දී ම විවිධ සංස්කෘතීන්ට අයත් පිරිස් එක් ව කටයුතු කිරීම තුළින් අත්කර ගත් ජයග්‍රහණ කැපී පෙනේ. සමාජීය, දේශපාලන, ආර්ථික අංශවල දී ද සියලු ජනකොටස්වල සහභාගීත්වය දක්නට ලැබේ.

ආහාර, ඇඳුම් පැළඳුම්, භාෂාව, කලාව, ක්‍රීඩාව වැනි අංශවල දී අප රටේ සංස්කෘතික සමෝධානය මැනවින් විද්‍යාමාන වේ.

අපේ ප්‍රධාන ආහාර වේලක විවිධ සංස්කෘතීන්ට අයත් ආහාර වර්ග දක්නට ලැබේ.



**3.6 රූපය**
**විවිධ සංස්කෘතීන්ට අයත් ආහාර වර්ග**

උදාහරණ ලෙස බත්, පාන්, වඩේ, ආප්ප, බුරියානි, තෝසේ වැනි විවිධ ජන කොටස්වලට ආවේණික ආහාර වර්ග පොදුවේ සියලු ම දෙනා පරිභෝජනයට ගනිති.

ඇඳුම් පැලඳුම්වල ද මේ පොදු බව දක්නට ලැබේ. පිරිමින් අඳින යුරෝපීය ඇඳුම ද කාන්තාවන්ගේ සාරිය, සල්වාර්, කුර්තා වැනි ඇඳුම් ද පොදුවේ සෑම ජනකොටසක් අතර ම ජනප්‍රිය ය.

අපේ ජාතික ක්‍රීඩා කණ්ඩායම්වල සෑම ජන වර්ගයකට ම අයත් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සහභාගීත්වය දක්නට ලැබේ.

සිංහල, ද්‍රවිඩ භාෂාවල මිශ්‍ර භාෂා ලක්ෂණ දක්නට ලැබේ. විවිධ ආගමික උත්සවවල දී සියලු ම ජනකොටස්වල සහභාගිත්වය දැකිය හැකි ය. බෞද්ධ වෙහෙර විහාර ආශ්‍රිත ව දේවාල දක්නට ලැබේ. කලා අංශවල දී සංස්කෘතික සමෝධානය වඩාත් කැපී පෙනේ.

රටේ විවිධ රැකියා, පොදුවේ ගත් කල කෘෂි කර්මාන්තය, ධීවර කර්මාන්තය, වෙළෙඳාම වැනි අංශවල සියලු ජනකොටස් නිරත වෙති. ඒ සියල්ලෝ ම රටේ ආර්ථිකයට දායක වෙති.

විවිධ පුද්ගලයින්ගේ හා කණ්ඩායම්වල සතුටට හේතු වන පරිදි සහජීවනයෙන් කටයුතු කිරීම කෙතරම් වැදගත් ද? ඒ අනුව බහු සංස්කෘතික සමාජයක පුරවැසියකු වන්නට ලැබීම ද භාග්‍යයකි. එමගින් එක් එක් සංස්කෘතිය විසින් සිය ඓතිහාසික විකාශනයේ දී අත්පත් කරගත් ජයග්‍රහණ සියල්ල භුක්ති විඳින්නට අපට අවස්ථාව ලැබී තිබේ.

සාමය, සුරක්ෂිතභාවය, සාධාරණ බව රටවැසි සියලු දෙනාගේ ම අයිතිවාසිකම් වේ. සියලු දෙනාට එක් ව සතුටින් ජීවත්වීමට එක්සත් හා ශක්තිමත් දේශයක් අපි ගොඩනගා ගත යුතු වෙමු. විවිධත්වයේ සුවිශේෂ වූ ශක්තිය උකහා ගනිමින් එක ම ජාතියක් ගොඩනගමු.

"එක මවකගේ දරු කැල බැවිනා-යමු යමු වී නොපමා" යනුවෙන් අපේ ජාතික ගීයේ දැක්වෙන උදාර අදහස සැබෑ කරමින් එකට එක් වී රටේ අනාගතය වෙනුවෙන් කැප වී කටයුතු කිරීම අපගේ යුතුකම සේ සලකමු.

**ක්‍රියාකාරකම් 3.5**

1. "වෙනස්කම් තුළින් එකමුතු බව" යන්න අපේ රටේ සංවර්ධන කාර්යයේ දී අදාළ කරගත හැකි ය." සංස්කෘතික සමෝධානය තුළින් විවිධ ක්ෂේත්‍රවල දී අප රට ලබා ඇති ජයග්‍රහණවලට උදාහරණ ලැයිස්තුවක් සකස් කරන්න.
2. "බහු සංස්කෘතික සමාජයක උපදින්නට ලැබීම ද භාග්‍යයකි." යන මාතෘකාව ඔස්සේ පුවත්පතකට යොමු කිරීම සඳහා ලිපියක් සකස් කරන්න.
3. බහු සංස්කෘතික සමාජයක් වශයෙන් සහයෝගයෙන් ජීවත් වීමට අපට නොහැකි වූ අවස්ථා ගැන ඔබ දන්නවා ද? එසේ වීමට හේතු සොයා ඒවාට පිළියම් යෝජනා කරන්න.
4. ඔබේ අසල්වැසියන් අතර හෝ පාසලේ හෝ ඔබේ පන්තියේ ශිෂ්‍යයන් වශයෙන් විවිධ ආගම් අදහන අය සිටිය හැකි ය. සියලු දෙනා සමග සුහදතාවෙන් හා අන්‍යෝන්‍ය විශ්වාසයෙන් කටයුතු කිරීම සඳහා ඔබේ යෝජනා කෙටියෙන් දක්වන්න.